ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2017 දෙසැම්බර් 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය - 2017 නොවැම්බර්

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 නොවැම්බර් මාසයේ දී 58.8 ක දර්ශක අගයක් වාර්තා කරන ලද අතර, එය 2017 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 4.0 ක ඉහළ යාමකි. ඒ අනුව, 2017 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව නොවැම්බර් මාසයේ දී නිෂ්පාදන කටයුතු ඉහළ වේගයකින් වර්ධනය වීමක් පිළිඹිබු වේ. මේ සඳහා, විශේෂයෙන්ම උත්සව සමයට සමගාමීව, ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන කටයුතු සඳහා ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් වර්ධනය වූ නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක හේතු විය. තවද, 2017 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව සේවා නියුක්ති සහ ගැනුම් තොග යන උප දර්ශක ද වැඩි වේගයකින් වර්ධනය විය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය සඳහා අදාළ වන උප දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. තවද, සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලද අතර, ඒ අනුව නොවැම්බර් මාසයේ දී නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සමස්තයක් ලෙස වර්ධනයක් පිළිඹිබු කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ඉහළ අගයක් වාර්තා කරන ලද නමුත්, මෙය පසුගිය මාසයට සාපේක්ෂව සුළු පසුබෑසීමක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**, 2017 ඔක්තෝබර් මාසයේ දී වාර්තා වූ 55.3 ක දර්ශක අගයට සාපේක්ෂව නොවැම්බර් මාසයේ දී 57.4 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. 2017 නොවැම්බර් මාසයේ දී සේවා අංශය සාමාන්‍ය වේගයකින් වර්ධනය වූ බව මෙමගින් පෙන්නුම් කෙරෙයි. ව්‍යාපාර ක්‍රියාකාරකම්, නව ව්‍යාපාර සහ සේවා නියුක්ති උපදර්ශක මෙම වර්ධනය සඳහා දායක විය. 2017 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව නොවැම්බර් මාසයේ දී ඉදිරි මාස 3 සඳහා අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය වූ අතර නිම කිරීමට ඇති කාර්යයන් පහළ යන ලදී. සේවා සැපයීමේ මංපෙත්වල වර්ධනය සහ නව තාක්ෂණික දියුණු කිරීම් හේතුවෙන් ප්‍රධාන වශයෙන් මූල්‍ය සහ සන්නිවේදන අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් දක්නට ලැබුණි. උත්සව සමය සඳහා ආයතන විසින් ඉහළ සේවක පිරිසක් සමග සූදානම් වීම සහ කලක සිට පැවති ඇබෑර්තු සඳහා බඳවාගැනීම් සිදු කිරීමත් සමග සේවා නියුක්තිය සිව් මසකින් වාර්තාකළ ඉහළම අගය වාර්තා කරන ලදී. අය කරන මිල ගණන් සැලකීමේදී එය 2017 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව නොවැම්බර් මාසයේ දී අඩු වේගයකින් ඉහළ ගිය අතර ප්‍රසාද දීමනා, උත්සව අත්තිකාරම් සහ 2017 වසරේ භාවිතා නොකළ නිවාඩු සඳහා මුදල් ගෙවීම වැනි ඍතුමය ප්‍රතිලාභ ගෙවීම් හේතුවෙන් 2017 නොවැම්බර් මාසයේ දී අපේක්ෂිත ශ්‍රම පිරිවැය ඉහළ යන ලදී.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.